# සාරාංශය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණ වන්නේ පූර්ණ පෞරුෂයකින් යුත් ගුරුවරයෙක් බිහි කිරීමයි. එහිදී ඔවුන් ලබන වෘත්තීය පුහුණුව ඉතා වැදගත් වේ. අද වන විට ගුරු අධ්‍යාපනය සපයන ආයතන රාශියක් පවතී.

වසරින් වසර අධ්‍යාපන පද්ධතියට එකතුවන නුපුහුණු උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව අධික බැවින් ඔවුන්ගේ වෘත්තීය පුහුණු අවශ්‍යතාව සපුරන ගුරු අධ්‍යාපන ආයතනවලට එම කාර්යය සම්පූර්ණ කිරීමට තවමත් නොහැකි වී තිබේ. රජය විසින් වරින් වර නොයෙක් කෙටි කාලීන පාඨමාලා මඟින් නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම ආරම්භ කර ඇතත් එමගින් ආධුනික ගුරුවරයාට ලැබෙන්නේ ඉගැන්වීම සඳහා අවශ්‍ය මූලික ප්‍රවේශයක් පමණි.

1981 වර්ෂයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දුරස්ත අධ්‍යාපන ක්‍රමය මඟින් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කර ඇති අතර එහි මූලික පරමාර්ථය වන්නේ අධ්‍යාපන පද්ධතිය තුළ රැඳී සිටින නුපුහුණු උපාධිධාරී ගුරුවරුන්ට වෘත්තීය කුසලතා ලබා දීමයි. එහිදී ගුණාත්මක වශයෙන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනේ ප්‍රායෝගික ඉගැන්වීම පාඨමාලාව මඟින් විවිධ වෘත්තීය කුසලතා, නිපුණතා ගුරුවරුන් තුළ ඇති කිරීම අපේක්ෂාවෙන් පාඨමාලාව ක්‍රියාත්මක කළයුතු බව අවධාරණය කර ඇතත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම තුළ ඉගැන්වීම සම්බන්ධව, කුසලතා සංවර්ධනය හා ඉගැන්වීම අධීක්ෂණය හා ඇගයුම සම්බන්ධව ගැටලු පවතී.

මෙම ගැටලුව සම්බන්ධයෙන් පර්යේෂකයාගේ අවධානය යොමු වී ඇති අතර ප්‍රායෝගික ඉගැන්වීම පාඨමාලාව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විමසීමට මෙම පර්යේෂණය යොදා ගෙන ඇත. පර්යේෂණයේ සුවිශේෂී අරමුණු හතරකි.

- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහනේ "ප්‍රායෝගික ඉගැන්වීම" පාඨමාලාවෙන් අපේක්ෂා කරන අරමුණු හා අන්තර්ගතය හඳුනා ගැනීම.

- "ප්‍රායෝගික ඉගැන්වීම" පාඨමාලාව සංවිධානය හා එහි ගුණාත්මක භාවය හඳුනා ගැනීම.

- "ප්‍රායෝගික ඉගැන්වීම" පාඨමාලාවට ඇති ශිෂ්‍ය සහභාගිත්වයේ ස්වභාවය විමසා බැලීම.

- "ප්‍රායෝගික ඉගැන්වීම" පාඨමාලාව අධීක්ෂණය හා ඇගයුම් ක්‍රියාවලියේ ඇති ගුණාත්මක තත්ත්වය විමසා බැලීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා දියත් කරන ලද පර්යේෂණය සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යොදා ගනු ලැබීය. කොළඹ, කුරුණෑගල, මහනුවර, ගාල්ල, මාතර යන ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථානවලට සම්බන්ධ 2007/2008 අධ්‍යයන වර්ෂවලට අයත් ගුරු ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100ක නියැදියක් ද, ප්‍රායෝගික ඉගැන්වීම අධීක්ෂණය හා ඇගයුම සිදුකරන ප්‍රමුඛාචාර්ය නියැදියක් ද විශ්වවිද්‍යාල කථිකාචාර්ය නියැදියක් ද සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවලින් ද අදහස් විමසන ලදී.

ගුරු සිසුන් හා ප්‍රමුඛාචාර්ය නියැදි වෙත සැපයූ ප්‍රශ්නාවලි හා විශ්වවිද්‍යාල කථිකාචාර්ය මණ්ඩලයෙන් අදහස් විමසීමෙන් සහ ගුරු සිසුන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය මගින් ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානයේ ගුණාත්මකභාවය පිළිබඳ පූර්ණ විමර්ශනයක් සිදු විය. දත්ත විශ්ලේෂණයේ දී ප්‍රස්තාර, ප්‍රතිශත වගු උපයෝගී කර ගෙන ඇත.

මෙම අධ්‍යයනය මගින් නිගමන කිහිපයකට එළඹිය හැකි විය. ප්‍රායෝගික ඉගැන්වීම් පාඨමාලාව සඳහා සුවිශේෂී අරමුණු මාලාවක් සකස් කිරීමේ අවශ්‍යතාව, ප්‍රායෝගික ඉගැන්වීම සහ පාඩම් සැලසුම් සකස් කිරීම සඳහා පවත්වන දින පාසල් හා කාර්ය සැසි සංඛ්‍යාව වැඩි කිරීම, ප්‍රමුඛාචාර්ය දැනුම යාවත් කාලීන කිරීම, ඇගයුම් පත්‍රිකාවේ නිර්ණායක වෙනස් කිරීමේ අවශ්‍යතාව මතු විය.

ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රියාවලියේ පවතින ගැටලු අතර ප්‍රමුඛාචාර්ය උපදෙස් ගුරු සිසුන්ට ප්‍රමාණවත් නොවීම, පාඩම් සැලසුම් ආකෘතිය පිළිබඳ ගුරු සිසුන් තුළ පවතින ඌන අවබෝධය, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගුරු සිසුන්ගේ සූදානම අවමවීම, ප්‍රමුඛාචාර්ය ගෙවීම් ප්‍රමාද වීම ආදී ගැටලු හඳුනාගෙන ඇත.

ගුරු සිසුන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය සඳහාත් ප්‍රමුඛාචාර්යවරුන්ගේ අධීක්ෂණ සහ ඇගයුම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය සඳහාත් යෝජනා ඉදිරිපත් කර ඇත. ඒ අතර, ප්‍රායෝගික ඉගැන්වීම් සංරචකය සඳහා සුවිශේෂී අරමුණු මාලාවක් සකස් කිරීම, ප්‍රායෝගික ඉගැන්වීම සහ පාඩම් සැලසුම් සකස් කිරීම සඳහා දින පාසල් හා කාර්ය සැසි සංඛ්‍යාව වැඩි කිරීම ප්‍රමුඛාචාර්ය දැනුම යාවත්කාලීන කිරීම යනාදිය වැදගත් වේ. එහෙයින් අනාගතයේ දී මෙම ක්ෂේත්‍රයන්හි ගුණාත්මක සංවර්ධනයක් සඳහා මෙකී යෝජනා පදනමක් සපයනු ඇත.